# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 6,974 — 1918ක්වූ නොවැම්බර් මස 1වෙනි දිනවූ සිකුරාදා.


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**No. 3,191, S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ දෙසැම්බර් මස 19වෙනි දිනවූ බෘහස්පතින්දා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ බෙන්තර වලල්ලාවිටිකෝරළේ කොඩාසගේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

සිතියම 10,961. ගම—නානාතොටපලාත.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල. රු. |
|---|---|---|---|---|---|
| 1 | ඊරියගහවෙල | .. කේ. ඇලැක්සැන්ඩර් ද අබ්‍රෙවු | .. කුඹුර | .. 0 1 1 | 100 |

මෙම ඉඩම ගැණ වැඩිදුර කාරණා දකුණු දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වෙයර් ජනරාල් උන්නාන්සේ ගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස 26වෙනි දින කොළඹ
මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම් වර්‍ගය.

---

**No. 1,301, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ජනවාරි මස 30වෙනි දිනවූ බෘහස්පතින්දා දවල් 12ට බදුළු කච්චේරියේදී බද්දට වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ උඩුකිඳ පලාතේ පිහිටා තිබෙන බිම් කැබලි 1ක්.

සිතියම 2,007. ගම—උඩුකිඳ පලාතේ දඹවිනිපලාතකෝරළේ රත්කරව්වේගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 4 | නිදන්ගොඩපතන නොහොත් කහට ගහකඩුල්ලේපතන | .. බොඹුහින්නේ මැදගෙදර කිරිබන්ඩා | .. පතන | .. 3 2 35 |

### බදු කොන්දේසි.

(*a*) තක්සේරු මුදල වන රුපියල් 24ක "පිරිමියම්" මෙන් ලාබ මුදල පිට අවුරුද්දකට අක්කරයකට හෝ එයින් කොටසකට වුවත් රුපියල් 2ක ගණනේ ඉහත සඳහන්වෙන ඉඩම සදාකාලිකේට බදුදෙනු ලැබේ.

(*b*) පළමුවෙනි අවුරුදු හයේ අවුරුදු බදු මුදල් මුල් ගණනෙන් තුනෙන් කොටසක් වේ.

(*c*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(*d*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රාජසන්තකය කියා පලකරණු ලැබේ.

(*e*) පලතුරු වැවීමට උවමනාකරණ ගොඩනැගිලි සෑදීමට පමණක් අවසර දෙනුලැබේ.

(*f*) ඉඩම වැසියන්ට උවමනාකරණ පලතුරු වැවීමට පමණක් පාවිච්චිකළ යුතුයි.

(*g*) බදුකාරයා විසින් මෙම ඉඩම අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද, ඉතුරු ඉඩම තවත් අවුරුදු 5ක් ඇතුළත වැවීමට පොරොන්දුවිය යුතුයි. මෙම පොරොන්දු ඉෂ්ටනොකළොත් ඉඩමෙන් වවා තිබෙන කොටස හැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරණු ලැබේ.

(*h*) අවුරුදු 30කට වරක් බද්ද අළුත්වැඩියා කෙරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 30ට ගෙවිවාවූ බදු මුදලින් භාගයකට වැඩි නොවේ.

(*i*) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමණකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කෙරීමටවත්, බාර දීමට හෝ ලියාදීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කෙරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණා ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස 30වෙනි දින කොළඹ
මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම් වර්‍ගය.

**No. 991, P. of S.**—සබරගමු දිසාවේ කෑගල්ලේ උපඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ දෙසැම්බර් මස 17වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 11ට කෑගල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර දෙන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ කෑගල්ල පලාතේ බෙලිගල්කෝරලේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 54ක්.

සිතියම 2,784. ගම—දෙරවක.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | මකුරුගලහේන්යාය | වික්‍රමසිංහ පෙරකදොරුතැන | එලිකරපු හේන | 51 | 3 | 19 |
| 2 | පුහුලේහේන්යාය | එම | එම | 10 | 1 | 18 |
| 3 | කරත්තපාර (දූනට කපන) | එම | වෙන්කර තැබීමට | 0 | 2 | 7* |
| 4 | කැකුනහේන්යාය | එම | එක් අවුරුදු රබර් | 36 | 3 | 24 |
| 5 | එම | එම | එම | 4 | 1 | 7 |
| 6 | එම | එම | එම | 0 | 0 | 21 |

සිතියම 2,785. ගම—දෙරවක.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | හදුරවේහේන්යාය | වික්‍රමසිංහ පෙරකදොරුතැන | පොඩි රබර් | 157 | 0 | 26 |
| 2 | එම | එම | එම | 0 | 1 | 6 |
| 3 | පොල්ගහමුලහේන | ජේ. උක්කුබන්ඩා | හේන | 1 | 2 | 24 |
| 4 | දෙරුවේහේන | කිරිමැනිකා සහ තවත් අය | එම | 5 | 2 | 15 |
| 5 | ලිනියගල්ලේහේන | ජේ. ලෙන්තුවා සහ තවත් අය | එම | 4 | 1 | 33 |
| 6 | හදුරුගල | වික්‍රමසිංහ පෙරකදොරුතැන | වෙන්කර තැබීමට | 1 | 0 | 32* |
| 7 | දෙසියන්නේකන්දගල | ආණ්ඩුව | එම | 4 | 3 | 37* |
| 8 | පාර සහ පාරටඇරපු බිම | වික්‍රමසිංහ පෙරකදොරුතැන | එම | 0 | 0 | 35* |

සිතියම 2,786. ගම—දෙරවක.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | දෙහිගහහේනඅස්වැද්දුම | ජී. සියාතුහාමි සහ තවත් අය | ඇරී තිබෙන කුඹුර | 1 | 0 | 13 |
| 2 | මුදුපැන්හේන්යාය | වික්‍රමසිංහ පෙරකදොරුතැන | අවුරුදු 1½රේ රබර් | 115 | 2 | 5 |
| 3 | පාර සහ ඊට ඇරපු බිම | එම | හේන වෙන්කර තැබීමට | 0 | 0 | 13* |
| 4 | එම | එම | එම | 0 | 1 | 12 |
| 5 | මුලත්වත්තකන්දහේන්යාය | එම | අවුරුදු 1½රේ රබර් | 50 | 1 | 19 |
| 6 | උඩුහොඳුවේවත්ත | ඩබ්ලිව්. එච්. කිරිබන්ඩා සහ තවත් අය | 4 අවුරුදු පොල් | 4 | 0 | 30 |
| 7 | පාර සහ ඊට ඇරපු බිම | වික්‍රමසිංහ පෙරකදොරුතැන | වෙන්කර තැබීමට | 0 | 1 | 37* |
| 8 | අලකොටුවේහේන | එම අය සහ තවත් කෙනෙක් | 8 අවුරුදු පොල් | 0 | 3 | 4 |
| 9 | කෝන්ගහතැන්නේහේන්යාය | වික්‍රමසිංහ පෙරකදොරුතැන | අවුරුදු 1½රේ රබර් | 39 | 0 | 8 |
| 10 | මාදෙනියවත්ත | එම | 6 අවුරුදු රබර් | 11 | 2 | 1 |
| 11 | එම | එම | 10 අවුරුදු රබර් | 4 | 2 | 35 |
| 12 | පොල්වත්ත | එම | 5 අවුරුදු පොල් | 24 | 3 | 25 |
| 13 | එම | එම | 6 අවුරුදු රබර් | 34 | 1 | 31 |
| 14 | හබරගේපුරන | එම | ඇරී තිබෙන කුඹුර | 0 | 0 | 34 |
| 15 | එම | ඩබ්ලිව්. ලෙන්තුවා සහ තවත් අය | කුඹුර | 1 | 0 | 6 |
| 16 | හිඳෙනියේකුඹුර | වික්‍රමසිංහ පෙරකදොරුතැන | එම | 1 | 2 | 7 |
| 17 | කැටකාලගහහේන සහ හබරගේපුරන | එම | එම | 2 | 1 | 16 |
| 18 | පිල්ලෑව | එම | පල්කඩ | 0 | 0 | 39 |
| 19 | කැටකෑලගහමුලඅස්වැද්දුම | වික්‍රමසිංහ පෙරකදොරුතැන | එම | 0 | 2 | 25 |
| 20 | පරගහමුලඅස්වැද්දුම | එච්. රත්තරනා සහ තවත් අය | කුඹුර | 0 | 1 | 31 |
| 21 | මකුල්ගහකොටුව | වික්‍රමසිංහ පෙරකදොරුතැන | එම | 0 | 1 | 1 |
| 22 | එම | එච්. වත්තුවා සහ තවත් අය | එම | 0 | 1 | 12 |
| 23 | එම | වික්‍රමසිංහ පෙරකදොරුතැන | එම | 0 | 1 | 22 |
| 24 | එම | එම | එම | 1 | 0 | 27 |
| 25 | එම | එම | එම | 0 | 1 | 15 |
| 26 | එම | එම | 5 අවුරුදු රබර් | 32 | 3 | 29 |
| 27 | උඩුවෙලදෙරුවේහේන | එම | 4 අවුරුදු රබර් | 9 | 2 | 4 |
| 31 | ගොඩමඩදෙනිය | එම | පල්කඩ | 0 | 1 | 1 |
| 32 | හොරගහමුලහේන | එම | එක් අවුරුදු රබර් | 1 | 2 | 7 |
| 33 | මාදෙනියවත්ත | එම | 15 අවුරුදු රබර් | 138 | 3 | 24 |
| 34 | කෝන්ගහතැන්නේහේන්යාය | එම | 3 අවුරුදු රබර් | 40 | 3 | 10 |
| 35 | මාදෙනියවත්ත | එම | එම | 64 | 2 | 7 |
| 36 | හෙට්ටිරාලගේඅස්වැද්දුම | ඊ. අප්පුහාමි සහ තවත් අය | කුඹුර | 0 | 3 | 12 |
| 37 | කැටකාලගහමුලඅස්වැද්දුම | වික්‍රමසිංහ පෙරකදොරුතැන | එම | 0 | 3 | 32 |
| 39 | මාදෙනියවත්ත | එම | 6 අවුරුදු රබර් | 24 | 2 | 31 |
| 40 | අඩිපාර සහ ඊට ඇරපු බිම | එම | වෙන්කර තැබීමට | 0 | 1 | 17* |
| 41 | මීපන්නාව සහ තියඹරබඩහේන්යාය | එම | එක් අවුරුදු රබර් | 38 | 0 | 15 |
| 42 | එම | එම | කමත | 0 | 0 | 15 |
| 43 | එම | එම | එක් අවුරුදු රබර් | 0 | 1 | 0 |
| 44 | මිනිගේහේන | සිඤ්ඤප්පු සහ තවත් අය | හේන | 1 | 1 | 22 |

* විකිණීමට නොවේ.

මෙම ඉඩම් සම්බන්ධව වැඩිදුර කාරණ කෑගල්ලේ උපඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ ප්ලෑන් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1918ක්වූ ඔක්තෝබර් මස 29වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම් වෙනුවට.

---

**No. 992, P. of S.**—සබරගමු දිසාවේ රත්නපුරේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ දෙසැම්බර් මස 16වෙනි දිනවූ සඳුදා පස්වරු 1ට රත්නපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කේ පිහිටා තිබෙන බිම්කැබලි 8ක්.

සිතියම 2,737. ගම—හල්පෙ, කඩවත්තුකෝරලේ. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගුරුකපුරේමුකලාන | — | කැලේ | 1 | 2 | 37 | —* |

* කඩවත්ඔය අරක්ෂක බිම්කැබෙල්ල, විකුණනු නොලැබේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 2 | ගුරුකඳුරේපතන | — | පතන | 3 0 15 | 30 |
| 3 | එම | — | එම | 0 0 21 | —† |

සිතියම 2,738. ගම—හල්පෙ, කඩවතුකෝරළේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | ඇට්ට්‍රික්වත්ත | ඕ. එච්. වොරන්මහත්මයා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබැල්ල | අවුරුදු 7ක් පමණවූ තේ | 0 0 2 | —‡ |
| 2 | එම | එම | එම | 0 1 32 | 500 |
| 3 | ගුරුකඳුරේපතන | — | පතන | 4 0 25 | 30 |
| 4 | එම | — | එම | 0 2 21 | —‡ |
| 5 | එම | — | එම | 0 0 8 | —† |
| 6 | ඇට්ට්‍රික්වත්ත | ඕ. එච්. වොරන්මහත්මයා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබැල්ල | අවුරුදු 7ක් පමණවූ තේ | 0 1 7 | 500 |
| 7 | එම | එම | එම | 0 0 6 | —† |

සිතියම 2,751. ගම—හල්පෙ, කඩවතුකෝරළේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | දවටගහමඩිත්ත | ඇම්. ආර්. ද තෙලේනිස්අප්පු සහ පුත්‍රයින් විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබැල්ල වත්ත | | 0 0 11 | 30 |

සිතියම 2,725. ගම—තිඹොල්කැටිය, අටකලන්කෝරළේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 3 | තඹලගොඩයාය | ලියනගෙ සාමිඅප්පු විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබැල්ල | වත්ත | 0 1 1 | 30 |
| 4 | එම | ජේ. සාන්තුහාමි විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබැල්ල | එම | 0 3 0 | 30 |

සිතියම 88. ගම—මගුරුගොඩ, නවදුන්කෝරළේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 3*n* | අළුපොත මූකලාන නොහොත් මගුරුගොඩ මූකලාන | ජේ. පී. අබේරත්න විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබැල්ල | අවුරුද්දක් පමණවූ රබර් | 0 2 37 | 100 |

† අඩිපාර ආරක්ෂක බිම්කැබැල්ල විකුණනු නොලැබේ. ‡ දෙල ආරක්ෂක බිම්කැබැල්ල විකුණනු නොලැබේ.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණා සබරගමු පලාතේ රත්නපුරේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගන්ට පුළුවන.

වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස 30වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දකුණුපැත්තෙන් ගල්කිස්සේ ස්ටේෂන්පලට පැමිණීමට අලුත් පාරක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියම 16,824. ගම—ගල්කිස්ස.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 5 | ගල්කිස්සෙවත්ත | පොල්ගස් 60ද, අඩිපාරක්ද තිබේ | හරමානිස් සොයිසා | 0 2 6·45 |
| 8 | එම | ලිඳක්ද, මඩුවක්ද, පොල්ගස් 18ද තිබේ | මාර්සල් ගෝමස් සහ වෙන අය | 0 0 35·90 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 25වෙනි දින දවල් 1ඟේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස 26වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—අවිස්සාවේල්ලේ අහිතු වළලන ස්ථානයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 16,837. ගම—අවිස්සාවැල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | උක්වත්තකැලේ | කැලෑව | ඒබ්‍රහීම් බින් අහමඩ් | 0 0 16 |
| 2 | කෝටෙබොදවත්ත | රබර්ගස් තිබේ | එම | 2 1 33·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 25වෙනි දින දවල් 12ගේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ ඔක්තෝම්බර් මස 25වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ අඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—මඩවල සිට තෙල්දෙනිය හරහ නුගේතැන්නට යන කඩුලු පාරේ හැතැප්ම දහසය ලඟ ප්‍රසිඩ වැඩදෙපාතීමේන්තුවේ ගල්කඩන වළකට ගැණීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ අඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියම 6,877. ගම—රඹුක්වැල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පුස්සැල්ලේවත්තේහේන | හේන | හන්ගිඩිගෙදර අප්පු සහ තවත් අය | 0 0 11 |
| 2 | එම | එම | එම | 0 2 30·8 |
| 3 | දිස්නාවලහේන | එම | මැදගෙදර පුංචි බන්ඩා සහ තවත් අය | 0 0 18·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 22වෙනි දින පස්වරු 2කේ කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 1වෙනි
දින මහනුවර කච්චේරියේදීය.

සී. ඇස්. වෝන්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ අඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—මස්මරණ මඩුවකට සහ කුණුකසල දැමීම පිණිස මෙහිපහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ අඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියම 6,879. ගම—රඹුක්වැල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කැබැල්ලදෙනිය | වත්ත | ඇස්. ඇම්. කේ. කාදර්මීරා සයිබු | 0 0 23·4 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 29වෙනි දින පස්වරු 2කේ කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 1වෙනි
දින මහනුවර කච්චේරියේදීය.

සී. ඇස්. වෝන්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ අඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම් :—රත්නපුරේ සිට කොළඹට යන දුම්රිය පාරේ හැතැප්ම හැටේ කනුව ලඟ වෙඩිතැබීම පුහුණුකරණ ස්ථානයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ අඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියමේ නො. 2,791. ගම—මලන්ගම, කුරුවිටිකෝරළේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | අට්ටාලවත්තේගොඩැල්ල | වැව්ච්ච කැලේ | ද හූඩ්ව් දෙස්තර මහත්මයා සහ තවත් අය | 0 1 35·3 |
| 2 | අට්ටාලවත්තේදෙනිය නොහොත් විලකොලදෙනිය | දෙනිය | ඩබ්ලිව්. එච්. ද සොයිසා මහතාගේ බූදලේ උරුමක්කාරයෝ සහ තවත් අය | 0 0 34 |
| 3 | එම | අගල්කානුව | එම | 0 0 01 |
| 4 | අට්ටාලවත්තලහදෙනියේකුඹුර | කුඹුර | එම | 0 0 06 |
| 5 | අට්ටාලවත්තේදෙනිය නොහොත් විලකොලදෙනිය | දෙනිය | එම | 0 2 20·8 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 23වෙනි දින පස්වරු 1කේ කනිසමට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස 26වෙනි
දින රත්නපුර කච්චේරියේදීය.

බී. කොන්ස්ටන්ටැසින්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කළුතර දැන්වීම නො. 7,044.]

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 1වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත දක්වන ඉඩමට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ අඥාපණත්වල ප්‍රකාරයට පත්කරතුලැබූ කළුතර කච්චේරියේ උපජ්ජන්ත උන්නාන්සේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට එකී ඉඩමට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී උපජ්ජන්ත උන්නාන්සේට ඉහතකී අඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

සී. වී. බ්‍රෞන්,
ආණ්ඩුවේ උපජ්ජන්ත උන්නාන්සේ වම්හ.

### ඉඩමේ තොරතුරු.

බස්නාහිර දිසාවේ කළුතර දිස්ත්‍රික්කේ නැගෙනහිර පස්දුන්කෝරළේ ගගබාඩපත්තුවේ යටගම්පිටිය යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටිය එනම්:—

මුල් සිතියම 15,257.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 4670 .. | මහඇලගොඩැල්ල (ඇලට සහ අඩිපාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය) .. | 0 3 36 |

මීට මායිම්—උතුරට මහ ඇලමෝදර ගොඩැල්ලද (නොම්මර 14,208 මුල් සිතියමේ නොම්මර $266\frac{1}{4}$ පෙන්වන බිම් කට්ටිය), නොම්මර 297,892 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමද; නැගෙනහිරට මහඇල ගොඩැල්ලද, ආණ්ඩුවට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය (නොම්මර 14,208 මුල් සිතියමේ නොම්මර 269 පෙන්වන බිම්කට්ටිය); දකුණට මහඇලද; බස්නාහිරට මෝල්කාවේ සිට යටගම්පිටියට යන අඩිපාරද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 2051වෙනි පිටේ ප්ලෑනය බලනු.

---

[ඌව දැන්වීම නො. 7,045.]

### වර්‍ෂ 1897තේ, 1899යේ, 1900යේ සහ 1903තේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දැනුම්දීම.

මෙහි පහත සඳහන්වෙන ඉඩම් සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්‍ෂ 1918ක්වූ නොවැම්බර් මස 1වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත බදුළු කච්චේරියට ඇවිත් ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙණීසිට එකී ඉඩම් හෝ එයින් කොයියම් එකකට තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම කියා නොසිටියොත් එකී ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් වර්‍ෂ 1897තේ 1වෙනි ආඥාපණතෙන් උන්නාන්සේට ලැබී තිබෙන බලපුළුවන්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම් රජසන්තක ඉඩම් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇෆ්. බාව්ලව්,
ඌවේ ආණ්ඩුවේ ඒජන්ත වෙනුව.

කියන්නේ මේ ඉඩම් ගැණයි.

මීට යාකරණලද සිතියමේ* පෙණෙන ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ වැල්ලවායේ කන්දපල්ලකෝරළේ කිරිමැටියේ යන ගම පිහිටා තිබෙන බිම්කට්ටි:—

මුල් සිතියම 1,963.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 1 .. | කළුගොමුවේවත්ත .. | 6 0 31 | 4 .. | කළුගොමුවේපතන .. | 17 2 34 |
| 2 .. | කළුගොමුවේපතන .. | 9 2 10 | | | |
| 3 .. | කළුගොමුවේවත්ත .. | 3 0 35 | | | 36 2 30 |

මීට මායිම්—උතුරට රජසන්තක කළුගොමුවේ පතනද; නැගෙණහිරට රජසන්තක කළුගොමුවේ පතන සහ මල ආරද; දකුණට කුඩාඔය සහ බස්නාහිරට රජසන්තක කළුගොමුවේ පතන සහ මමින්නේආරද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 2053වෙනි පිටේ ප්ලෑනය බලනු.

---

[කෑගල්ල දැන්වීම නො. 7,046.]

### වර්‍ෂ 1897තේ, 1899යේ, 1900යේ සහ 1903තේ මුඩු ඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දැනුම්දීම.

වර්‍ෂ 1918ක්වූ නොවැම්බර් මස 1වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත සඳහන්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් කෑගල්ලේ කච්චේරියට ඇවිත් කෑගල්ල දිස්ත්‍රික්කේ උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේට මුඩුබිම් සම්බන්ධ ආඥාපණත්වලින් ලැබී තිබෙන බලපුළුවන්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙණහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දැනගත යුතුයි.

ජී. ඇෆ්. ආර්. බ්‍රවුනිං,
ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ වෙනුව.

### ඉඩම්වල තොරතුරු.

සබරගමු දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කේ පරණකුරුකෝරළේ බටහිර තුන්පලාතපත්තුවේ ගැවිලිපිටිය යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි එනම්:—

මුල් සිතියම 2,716.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 .. | අම්පිටිගොඩහේන්යාය නොහොත් නාගහමුලහේන .. .. | 1 1 13 |
| 2 .. | අම්පිටිගොඩහේන්යාය, නාගහමුලහේන නොහොත් දූලහිටියාවගාව මූකලාන .. | 9 3 16 |
| | | 11 0 29 |

මීට මායිම්—උතුරට රංකිරා සහ තවත් අය අයිතිකම්කියන දූලහිටියාවකුඹුරද, අගෝට අයිති ගල්කොටුවේ වත්තද, උඩුමාලෙබ්බේ සහ තවත් අය අයිතිකම්කියන මොරගහමුලහේනද, සේපාලා සහ තවත් අය අයිතිකම්කියන මොරගහමුල හේන සහ රංකිරා සහ තවත් අය අයිතිකම්කියන තැන්නපිටහේනද; නැගෙනහිරට 261,227 පිඹුරුකඩදාසියේ සඳහන් ඉඩම සහ බින්දු සහ තවත් අය අයිතිකම්කියන ගල්කොටුවේහේනද; දකුණට පිංචිඅප්පුවා සහ තවත් අය අයිතිකම්කියන මීගහ මුලහේනද, සොමලියා සහ තවත් අය අයිතිකම්කියන කනත්තේවත්තද, 55,935 පිඹුරුකඩදාසියේ සඳහන් ඉඩම, ආදම්ලෙබ්බේට අයිති රත්මල්ගල්ලේහේන සහ තැන්නපිටහේනද; බස්නාහිරට 281,841කේ පිඹුරුකඩදාසියේ සඳහන් ඉඩම සහ කුඹුරුවලට වතුරගන්නා ඇළද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 2054වෙනි පිටේ ප්ලෑනය බලනු.

## සනීපාරක්ෂක සභාවලට නිලනොලත් සමාජිකයින් තෝරාගැනීමේ දැන්වීම.

**මොරටුවේ ප්‍රදේශික සභාවට අයත් මොරටුවැල්ල යන කොඨාසයට නිලනොලත් සමාජික කෙනෙකු තෝරාගැනීම.**

වර්ෂ 1919ක්වූ දෙසැම්බර් මස 31වෙනි දින වනතුරු මොරටුවේ ප්‍රදේශික සභාවට අයත් මොරටුවැල්ල කොඨාසය වෙනුවෙන් පෙනීසිටීමට නිලනොලත් සමාජික කෙනෙකු තෝරාගැනීම පිණිස මෙම දෙසැම්බර් මස 2වෙනි දින පෙරවරු 10ට මොරටුවේ ලෝකල් බෝඩ් කන්තෝරුවේදී සභාවක් පවත්වනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

වර්ෂ 1918වේ නොවැම්බර් මස 22වෙනි දිනට මත්තෙන් සමාජික තනතුරට ඉල්ලීම්කාරයින්ගේ නාම යෝජනාකර එවන පත්‍ර එම කන්තෝරුවේදී භාරගනු ලැබේ.

ජේ. ජී. ෆ්‍රේසර්,
බස්නාහිර පළාතේ ඒජන්ත වම්හ.

වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස 29වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

වර්ෂ 1898වේ අවුරුද්දේ නොම්මර 13යේ සෞඛ්‍යසභා රෙගුලාසියේ 11වෙනි 12වෙනි වගන්තිවලට එකගව කෑගල්ලේ නගරයේ වැඩිදියුණුව සහ සනීප ආරක්ෂාකිරීමේ සෞඛ්‍ය සභාවට ආණ්ඩුව යටතේ නිලනොදරන්නාවූන් අතුරෙන් සභාකාරයෝ තුන්දෙනෙක් අවුරුදු දෙකකට එනම් වර්ෂ 1919ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් වර්ෂ 1920ක්වූ දෙසැම්බර් මස 31වෙනි දින දක්වා තෝරාගැනීම් සඳහා වර්ෂ 1918ක්වූ දෙසැම්බර් මස 11වෙනි බදාදා උදේ 9ට කෑගල්ලේ ප්‍රසිද්ධ ශාලාවේදී සම්මුතියක් පවත්වන්ට යෙදෙනබව මෙයින් දැනුම්දෙන්ට යෙදුනා ඇත.

සමාජිකයෙක් වීමට ඉල්ලුම්කරන අයෙක් ලියවිල්ලකින් ඉල්ලුම්කළ යුතුයි. එකී ඉල්ලීම කැමැත්තදීමට ඔබින දෙන්නෙකුගේවත් සාක්ෂි ඇතුව සම්මුති දිනට දසදවසකට ප්‍රථම හෝ ඊට කල්මත්තෙන් ලෝකල්බෝඩ් කන්තෝරුවට ඔප්පු කළයුතුයි.

බී. කොන්ස්ටන්ටයින්,
සබරගමුවේ ආණ්ඩුවේ ඒජන්තඋන්නාන්සේ වම්හ.

වර්ෂ 1918ක්වූ ඔක්තෝම්බර් මස 25වෙනි
දින රත්නපුරේ කච්චේරියේදීය.

## අ න්‍ය දැ න් වී ම්.

උතුරු අලුත්කුරුකෝරළේ දූසියපත්තුවේ නැදගමුවේ පදිංචි දොන් විලියම් ඒකනායක වන මම හලාවත දිස්ත්‍රික්කය ඇතුළත සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු මෙන් පත්කරනු ලැබීම පිණිස මෙවක් පටන් තුන්මාසයක් ඉකුත්වූ පසු රිජිස්ත්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලන්ට අදහස්කර සිටින බව වර්ෂ 1907තේ අංක 1 දරණ ආඥාපනතේ 8වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

ඩී. ඩබ්ලිව්. ඒකනායක.

වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස
14වෙනි දින නැදගමුවේදීය.

---

මෙහි පහත අත්සන්කරන මීගමු දිස්ත්‍රික්කුවේ යටියන පදිංචි වනසිංහආරච්චිගේ දොන් ක්‍රිස්තෝපර් වන මා කෑගලු දිස්ත්‍රික්කුව ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියා සහතික කෙරීමට බලයලත් ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙක් මෙන් පත්කරනුලබන ලෙස මෙතැන්පටන් තුන්මාසයක් ගියතැන රිජිස්ත්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලීමට අදහස්කරසිටින බව වර්ෂ 1907තේ අංක 1 දරණ ආඥාපණතේ 8වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

ව. දො. ක්‍රිස්තෝපර්.

වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස
7වෙනි දින යටියනදීය.

---

දූනට හංවැල්ලේ පදිංචි මුල්ලෙරියාවගේ බෙම්පි කුලතිලක වන මම වර්ෂ 1907තේ අංක 1 දරණ ආඥාපණතට යාකර තිබෙන අංක 1B අක්ෂරය දරණ ෂැඩ්‍යුල් පත්‍රයේ දෙවෙනි වගන්තියට අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු මෙන් කටයුතුකිරීමට පත්කරනු ලැබීම පිණිස මෙතැන් සිට තුන්මාසයක් ගියතැන රිජිස්ත්‍රාර් ජනරල් තුමාගෙන් ඉල්ලුම්කරන බව මෙයින් දැනුම්දෙමි.

ඇම්. බී. කුලතිලක.

---

මෙහි පහත අත්සන්කරණ මඩකලපු දිස්ත්‍රික්කුවේ මැන්මුනි පත්තුවේ කොටමුණේ, ඩේවිත් තම්බිමුත්තු තම්බිරාජ මම මඩකලපු දිස්ත්‍රික්කුවේ දෙමළ භාෂාවෙන් ඔප්පුලියා සහතික කිරීමට බලය ඇති නොතාරිස්කෙනෙකුමෙන් මා පත්කරණ ලෙස මෙතැන් පටන් තුන්මාසයක් ගියතැන රිජිස්ත්‍රාර් ජනරල් තුමාගෙන් ඉල්ලීමට අදහස්කරගන සිටින බව වර්ෂ 1907තේ අංක 1 දරණ ආඥාපනතේ අටවෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

ඩී. ටී. තම්බිරාජ.

වර්ෂ 1918ක්වූ සැප්තැම්බර් මස
28වෙනි දින යාපනයේදීය.

H. C. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.